# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2245/29 - 2021 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 2/1976 (iii)

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 4 වන වගන්තිය සමග කියවිය යුතු 25 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදනු ලැබ, වැවිලි අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝග.

**ජයම්පති මොල්ලිගොඩ,**
සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

2021 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

කලින් කල සංශෝධිත, 1984 දෙසැම්බර් මස 05 වැනි දිනැති අංක 326/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ගබඩා කිරීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 3 (ආ) වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් :-

"(ආ) මේ නියෝග යටතේ කරනු ලබන සෑම ලියාපදිංචි කිරීමක් සම්බන්ධයෙන් ම රුපියල් විසිපන් දහසක (රු. 25,000) ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් ගෙවිය යුතු ය." ;

(2) එහි 5 වන නියෝගයේ "රුපියල් පන්සියයක" යන වචන වෙනුවට "රුපියල් දසදහසක (රු. 10,000)" යන වචන ආදේශ කිරීමෙන්.

1A - G 34905 — 445 (2021/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*